## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - 2014

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ107(5) උපවගන්තිය, 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03

'' ත්‍යාග හා ප්‍රදාන'' ලෙස ආයතනයට ලැබී ඇති වත්කම් වලට අදාළව ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් සමාලෝචිත වර්ෂයේදී හඳුන්වා දී තිබූ නමුත් , ඉකුත් කාලපරිච්ඡේදයට අදාළ ක්ෂය ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබූ බැවින් ගිණුම්වල පෙන්නුම් කරන '' ත්‍යාග හා ප්‍රදාන'' ජංගම නොවන වත්කම් වලින් නියෝජනය නොකෙරුණි.

එසේම ත්‍යාග හා ආධාර වශයෙන් ලැබුණු ස්ථාවර වත්කම්වලට අදාළ සමාලෝචිත වර්ෂයේ රු.3,049,949 ක ක්‍රමක්ෂය වටිනාකම ත්‍යාග හා ආධාර ගිණුමට හර කරනු වෙනුවට රජයේ ප්‍රාග්ධන ආධාර ගිණුමට හරකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07

(i) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් වැඩිවූ ක්ෂය ප්‍රමාණය ඍජුවම සමුච්චිත අරමුදලට ගැළපිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ රු.14,131,278 ක් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය සඳහා වූ ක්ෂය ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ii) 2014 වර්ෂයේදී කඩා ඉවත්කරන ලද මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාර උපපාලිකා නිල නිවාසය 2011 ජනවාරි 01 දින ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් එවකට වත්කමේ පැවති ශුද්ධ වටිනාකම හඳුනා නොගෙන, ප්‍රත්‍යාගණිත සම්පූර්ණ අගය වූ රු.2,100,000 ක ප්‍රත්‍යාගණිත අතිරික්තයක් ලෙස සලකා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම වත්කම බැහැර කිරීමේදී සත්‍ය වශයෙන් වූ අලාභය නිවැරදිව ගණනය කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වලදී ප්‍රාග්ධනිත කරන ලද වියදම්ද නිශ්චිතව හඳුනාගෙන නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි 01 දිනට රු.318,070,239 කට ප්‍රත්‍යාගණනය කරන ලද ස්ථාවර වත්කම් වර්ග 06 ක ප්‍රයෝජනවත් ආයු කාලය නිශ්චය කර නොතිබූ බැවින් ස්ථාවර වත්කම් ක්ෂය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වෙන්දේසියක් මගින් ඉවත් කළ ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය, සැලකිල්ලට නොගෙන අලවියෙන් ලද සම්පූර්ණ මුදල වූ රු.158,529 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 21 වන ශත වර්ෂයට උසස් අධ්‍යාපන ව්‍යාපෘති (HETC) ආධාර වශයෙන් ලැබුණු පරිගණක හා උපාංග ඒකක 31 ක්ද විවිධ පාර්ශවයන්ගෙන් පුස්තකාලයට ලැබුණු පොත් පිටපත් 116 ක්ද වටිනාකම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව හා නිවැරදිව පවත්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් වලින් නිරූපිත වත්කම් වර්ග 05 ක රු.236,394,741 ක් වූ පිරිවැය, රු.21,793,508 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය, රු.92,848,684 ක් වූ සමුච්චිත ක්ෂය හා රු.143,546,057 ක් වූ ශුද්ධ අගයෙහි නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 හා 1989 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු.51,850 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර ගණනාවක සිට ඉදිරියට එමින් පවතින කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකළ රැඳවුම් මුදල් රු.441,822 ක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු විදේශ ගමන් සඳහා අත්තිකාරම් රු.79,000 ක් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 5.4.11. වගන්තිය | එකතු කළ අගය මත බදු (වැට් බදු) සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් වෙත බදු ඉන්වොයිසි පත්‍රයක් ලබා ගැනීමෙන් පසු එකතුකළ අගය මත බදු ගෙවිය යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 5.4.12 වගන්තිය | එකතු කළ අගය මත බදු (වැට් බදු) ගෙවීම පිළිබඳ විස්තරයක් ඊලඟ මාසයේ 15 දින හෝ එදිනට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා යැවිය යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 139 (7) හා 262 (2) | රු. 105,980ක් වටිනා ගෙවීම් වවුචර් 03 ක හා ඊට අදාළ උපයෝගී ලියවිලිවල ''ගෙවන ලදී'' මුද්‍රාව තබා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 231 (1) සහ 138 (6) හා (8) | නියැදි පරීක්ෂාවේදී අනාවරණය වු රු.1,534,475 ක් වටිනා ගෙවීම් වවුචර් 05 කට අදාළ බිල්පත් අමුණා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 394 | මාස 10 සිට වසර 03 ක් ඉක්මවු රු.443,489 ක් වටිනා අවලංගු කළ චෙක්පත් 62 ක් නැවත ගෙවීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබු අතර එයින් රු.10,180 ක් වටිනා චෙක්පත් 04 ක් අවලංගු කළ චෙක්පත් ලේඛනය තුළට ඇතුළත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2004 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 128 | වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු නියමිත කාලරාමුව තුළ සිදුකර නොතිබූ අතර පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ඒකක 1,939 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය වීම සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 1995 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළදී බාහිර පාඨමාලා වලට අදාළ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් අධ්‍යයන හා අනාධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.1,538,000 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග සඳහා වූ වත්කම් ලේඛනයෙහි චක්‍රලේඛයට අනුකූලව විස්තර ඇතුළත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ ඌනතාවය රු.9,425,582 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.98,204 ක් වුයෙන් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,327,378 ක පිරිහීමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ඉඩම් කොටසක් විකිණීමෙන් ලැබුණු රු.25,200,000 ක ලාභය හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.15,774,418 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතු

**(i)** සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කටයුතුවල යෙදුනු 934 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වැයකළ පුනරාවර්තන වියදම රු.296,228,629 ක් වුයෙන් ඒක ශිෂ්‍ය පිරිවැය රු.317,161 ක් වූ අතර ඉකුත් වර්ෂයේ අධ්‍යයන කටයුතුවල යෙදුනු 876 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වැයකළ පුනරාවර්තන වියදම රු.223,548,286 ක් වුයෙන් එම වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.255,192 ක් විය.

**(ii)** ආයතනයේ පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍යයින් 1112 දෙනෙකුගෙන් වර්ෂය අවසාන වනවිට 178 දෙනෙකු හෙවත් සියයට 16 ක් පාඨමාලා හැරගොස් තිබුණි.

**(iii)** විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පාඨමාලා ව්‍යවස්ථාවලියේ සඳහන් කාලයට වඩා සැලකිය යුතු ප්‍රමාදයක් සිදු කර තිබුණි.

**(iv)** ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය ලබා ගැනීමේ සුදුසුකම් 2011 වර්ෂයේ සංශෝධිත එම ව්‍යවස්ථාවලියේ ස්ථාන දෙකක දෙආකාරයට සඳහන් කර තිබීම කෙරෙහි විෂයමාලා සංවර්ධන හා ඇගයීමේ කමිටුවල අවධානය යොමු වී නොතිබුණි.

**(v)** ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධි පාඨමාලා ව්‍යවස්ථාවලියේ ඇතුළත් දේශන පැය ගණන් හා තථ්‍ය දේශන පැය ගණන් සැසඳීමේදී විෂයයන් 09 ක ව්‍යවස්ථාපිත පැය ගණනට වඩා පැය 166 ක් අඩුවෙන්ද විෂයයන් 06 ක පැය 146 ක් වැඩියෙන්ද දේශන පවත්වා තිබුණි.

**(vi)** ආයතනය තුළ විෂයමාලා සංවර්ධන හා ඇගයීමේ කමිටු 05 ක් ස්ථාපිත කර තිබුණද ඒවා සක්‍රීයව ක්‍රියාත්මක වූ බවට සාක්ෂි නොවීය.

(ආ) පශ්චාත් උපාධි හා බාහිර පාඨමාලා

**(i)** 1979 දෙසැම්බර් 21 දිනැති අංක 07 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලිය තුළ ආයතනයට පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීමට බලතල ලබාදී නොතිබු නමුත් ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමකින් තොරව ආයතනය විසින් වසර ගණනාවක් තිස්සේ පශ්චාත් උපාධි පාඨමාලා පවත්වා තිබුණි.

**(ii)** සිසුන් 20 දෙනෙකු ඇතුළත් කර ගනිමින් 2012 මැයි 21 දින ආරම්භ කරන ලද ආයුර්වේද වෛද්‍ය විශාරද 2012/ 2015 තුන් අවුරුදු පාඨමාලාවේ විෂය නිර්දේශය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(iii)** ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලා ව්‍යවස්ථාවලියේ 13 (III) ඡේදය පරිදි මාස 06 ක විදේශ පුහුණුවක් ලැබිය යුතු නමුත් මාස 03 ක පුහුණුවක් පමණක් ලබාදී තිබු අතර 13 (I) ඡේදය පරිදි අධ්‍යයන කාර්යසාධනය ඇතුළත්ව අපේක්ෂකයන් සඳහා වෙන වෙනම ගොනුද පවත්වා නොතිබුණි.

**(iv)** මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලාවන්හි පොදු කාර්ය වියදම්, මානව හා භෞතික සම්පත් පිරිවැය රජයේ මුදලින් දරා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේ සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු ඉඩමක පවත්වාගෙන යනු ලබන පිරිමි නේවාසිකාගාරය පිහිටි ඉඩම අත්පත් කරගෙන ගොඩනැගිල්ල වැඩිදියුණු කර නේවාසිකාගාරයකට සුදුසු තත්ත්වයෙන් පවත්වා ගෙනයාමට කටයුතු කර නොතිබූ අතර නේවාසිකාගාර උපපාලක තනතුර අහෝසි කර එහි පාලන කටයුතු නඩත්තු පරිපාලකවරයා වෙත පවරා තිබීමෙන් නේවාසිකාගාරයේ පාලනය නිසිලෙස සිදු නොවන බවටත් නේවාසිකාගාර ගාස්තු අය නොකරන බවටත් නිරීක්ෂණය විය. එමෙන්ම එක් උප

පාලිකාවක් යටතේ පවත්නා කාන්තා නේවාසිකාගාර 03 ක සහායිකාවන් නොමැතිවීම ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව කෙරෙහි බලපාන බවද නිරීක්ෂණය විය.

(ආ) පරිත්‍යාගශීලීන්ගෙන් සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා ලැබුණු මුදල්, එම කාර්ය සඳහා යොදා නොගෙන ස්ථාවර තැන්පතු ගිණුම් 04 ක ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.266,361 ක් විය.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති මේස මිලදී ගැනීමේ දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මිල ගණන් ෆැක්ස් මගින් එවීම නිසා ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒ හේතුවෙන් රු. 75,797ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතුවලට අමතරව ඖෂධ නිෂ්පාදනය කර අලෙවි කිරීමේ පරමාර්ථයෙන් 2012 වර්ෂයේදී රු. 1,280,000 ක් වැය කර ඖෂධ නිපදවීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබූ නමුත් ඖෂධ නිපදවීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා විද්‍යාගාරයක් ඉදි කිරීමට ප්‍රථම මිලදී ගත් රු. 319,460ක් වටිනා ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර 04ක් නිෂ්කාර්යව තිබුණි.

**4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පශ්චාත් උපාධි අංශයට පූර්ණ කාලීනව අනුයුක්ත කර සිටින වැඩබලන අධ්‍යක්ෂ හා කාර්යය මණ්ඩලයේ තුන් දෙනෙකු වෙත එම කාර්යය වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවා තිබියදී මාසිකව රු. 12,600 ක් බැගින් දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පාඨමාලා ආදායමෙන් රු. 215,800 ක් ගෙවා තිබුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලාවන්හි ප.ව.6.00 න් පසුව දේශන පැවැත්වීම සඳහා සැලසුම් සකස්කර නොතිබූ නමුත් දේශකවරුන් හතරදෙනෙකු විසින් ප.ව.8.00 න් පසුව දේශන පැය 12 ක් පැවැත්වූ බවට ගෙවීම් වවුචර්වල සඳහන් කරමින් රු.15,250 ක දේශන ගාස්තු ලබාගෙන තිබුණි.

(ඇ) ආයතනයේ උපාධි පාඨමාලා සඳහා අනුයුක්ත කථිකාචාර්යවරුන් 43 දෙනෙකු පශ්චාත් උපාධි පාඨමාලාවන්හි දිවා කාලයේ අධ්‍යයන කටයුතු සිදු කර දීමනා ලබා ගෙන තිබුණි.

(ඈ) ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලාවේ සිසුන් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 15 සිට මැයි 15 දක්වා කාලය තුළ විදේශ පුහුණුවක නිරතවීම හේතුවෙන් ආයතනය තුළ අධ්‍යයන කටයුතු හා සම්බන්ධ කාර්යයන් ඉටු නොකළ ද සහාය කාර්යය මණ්ඩලයට එම කාලය සඳහා රු.213,700 ක දීමනා ගෙවා තිබුණි.

(ඉ) 21 වන ශත වර්ෂයට උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතියෙන් ආධාර වශයෙන් ලැබුණු පරිගණක 29 ක් සඳහා එම ව්‍යාපෘතියෙන් මෘදුකාංග ලබා ගැනීමට කටයුතු නොකර, 2003 අංක 06 දරන බුද්ධිමය දේපල පනතේ ඇතුළත් විධිවිධාන නොසලකමින් බලපත්‍ර රහිත මෘදුකාංග පිටපත් යොදා ගෙන පරිගණක ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතු සඳහා ඉල්ලුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු. 3,302,059 ක් වටිනා යන්ත්‍ර 18 ක් ඊට වඩා රු. 13,877,984 ක් හෙවත් සියයට 420 ක් වැඩිපුර මිල වූ රු. 17,180,043 ක් ගෙවා මිලදී ගෙන තිබුණි.

**4.5 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දර්ශන විශාරද උපාධිය හැදෑරීම සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වෙත මානව, ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් 2006 හා 2008 වර්ෂයන්හිදී රු.590,000 ක ප්‍රදානයක් ලබාදී තිබුණද එම කථිකාචාර්යවරයා මේ දක්වාම එම උපාධිය හදාරා අවසන් කර නොතිබුණි.

(ආ) 1979 දෙසැම්බර් 21 දිනැති අංක 07 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 05 (ඇ) ඡේදයේ උපදෙස් පරිදි විශ්ව විද්‍යාලයේ අනුමැතිය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟත්වය ලබා නොගෙන සහතික පත්‍ර පාඨමාලා 03 ක් ආරම්භ කිරීම සඳහා රු.81,900 ක වියදමකින් පුවත්පත් දැන්වීමක් පළකර තිබුණද ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම මත එම පාඨමාලා ආරම්භ කර නොතිබූ අතර ඒ සඳහා දරන ලද වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මැයි මස සජ්ත වාර්ෂික නිවාඩු ලබාගත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වෙත මාස 04 ක් තුළ දේශන හා ප්‍රායෝගික පැය 10 ක් පමණක් ඉටු කිරීමට පවරා තිබූ අතර එයින් පැය 05 ක පමණක් අධ්‍යයන කටයුතුවල නිරත වී තිබුණි. එම කාලය සඳහා රු.539,634 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව ආයතනයේ කම්කරු තනතුරකට බඳවා ගත් අයෙකු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මුදා හැර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු. 391,459 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට 217 ක් වූ අනුමත මුළු කාර්ය මණ්ඩලයේ තනතුරු 29 ක් පුරප්පාඩු වී පැවති අතර පැවරුම් පදනම මත හා පුහුණුවන්නන් 16 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

**4.8 වාහන උපයෝජනය**

ආයතනය සතු වාහන 04 ක් සඳහා ධාවන සටහන් හා ලොග් පොත් අසම්පූර්ණව පැවතීම, ඉන්ධන ඇනවුම් ලේඛනයක් නොපැවතීම, ඉන්ධන ගැලපුම් හා ධාවනය කළ කිලෝමීටර් ගණන් ධාවන සටහන්හි නිවැරදිව ඇතුළත් නොකිරීම යන කරුණු නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් රු.42,913,000 ක් වූ කාර්යයන් 33 ක් අතුරෙන් ඇස්තමේන්තුගත වටිනාකම රු.20,100,000 ක් වූ කාර්යයන් 14 ක් ඇතුළු කාර්යයන් 22 ක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර සැලසුම් නොකළ රු.5,897,184 ක් වටිනා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යයන් 05 ක් කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ වූ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.6 වගන්තිවල උපදෙස් පරිදි කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

පුනරාවර්තන වැය විෂයයන් 03ක රු.204,915,000 ක් වූ අනුමත ප්‍රතිපාදනය රු.8,783,463 කින් හෙවත් සියයට 4 කින් සහ ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක රු.32,500,000 ක් වූ අනුමත ප්‍රතිපාදනය රු.15,546,265 කින් හෙවත් සියයට 48 කින් ඉක්මවා වැය කර තිබූ අතර ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කළ රු.9,400,000 ක් වූ මුළු ප්‍රතිපාදනය සහ තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර තිබූ රු.18,100,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු.9,855,061 ක් හෙවත් සියයට 54 ක් උපයෝගී කර නොගැනීමද යන කරුණු හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) තොග පාලනය
(ඉ) අත්තිකාරම්
(ඊ) ප්‍රසම්පාදන කටයුතු
(උ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතු
(ඌ) නේවාසිකාගාර පාලනය
(එ) වාහන පාලනය